**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සංවර්ධන කටයුත්තක් හේතුවෙන් පොල්ගහවෙල ළමා උද්‍යානයේ තිබූ රු.3,407,814 ක් වූ උපකරණ තවකාලිකව ඉවත් කර නැවත සවි කිරීමට කටයුතු යොදා තිබියදී ස්ථාවර වත්කම් ගිණුමෙන් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙන් එම උපකරණ වල වටිනාකම ඉවත් කර තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.431,666 ක් වූ සතිපොල ගොඩනැගිලි 06 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලේඛනය අනුව රු.485,000 ක් වූ ට්‍රැක්ටරයක් රු.99,000ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) තැන්පත් ලේඛනය අනුව රු.832,771 ක් වූ අවම ලංසු තැන්පත් වටිනාකම රු.616,158 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත පරිපාලන තැන්පත් රු.285,472 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.105,757 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

## 1.3.2 නොසැසඳුණු ගිණුම්

ගිණුම් විෂයයන් 11 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අනුව වූ ශේෂ අතර, රු.29,380,770 ක වෙනසක් පැවතුණි.

## 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට රු.61,068,747 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂවලින් රු.6,892,060 ක් සඳහා කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට රු.77,797,683 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ සඳහා කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබුණි.

(ii) වර්ෂ 1 සිට වර්ෂ 19 දක්වා කාලයක සිට පවතින රු.24,105,803 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,644,264 ක් වූ ගිණුම් විෂයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 59 රීතිය | - | සභා බල ප්‍රදේශයේ සමීක්ෂණ පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 214 රීතිය | - | සභාව සතු සියළුම දේපල හා භාණ්ඩ සමීක්ෂණය කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) 217 සහ 218 රීති | | | ඒකක 4 ක ගොඩනැගිලි හා ඒවා පිහිටි ඉඩම් ලේඛනගත කර නොතිබූ අතර ඉඩම් පිළිබඳ සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණි |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | 1,571,579 | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 අති විශේෂ ගැසට් පත්‍රය | 1,840,000 | සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08 කින් පෙරසැරි ගාස්තු අයකර නොතිබුණි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

---------------------------------------------------------

සභාව සතු ඉඩම් දෙකක වටිනාකම වූ රු.2,203,363 ක් නිසි අධිකාරී බලයකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.220,059 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,044,465 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 11,096 | 11,264 | 8,165 | 7,436 | 9,841 | 10,158 | 8,164 | 7,482 |
| (ii) කුලී | 9,090 | 8,874 | 8,735 | 3,526 | 6,113 | 7,162 | 6,814 | 2,477 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,626 | 481 | 480 | - | 449 | 505 | 311 | - |
| (iv) වෙනත් ආදායම් | 121,460 | 94,135 | 94,132 | 15,962 | 116,993 | 95,518 | 95,516 | 33,564 |
| එකතුව | 144,272 | 114,754 | 111,512 | 26,924 | 133,396 | 113,343 | 110,805 | 43,523 |

සටහන

- සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂයන්ට අදාළව හිඟහිටි ආදායමෙන් රැස්කළ රු.6,281,142 ක අයවීම් ඇතුළත්ව තිබුණි.
- ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් සභාව විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් අතර වෙනස්කම් පැවතුණි.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

**---------------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම රු.මි.114 ක් වූ අතර, රැස්කළ ආදායම රු. මි.111 ක් විය. ඒ තුල ඉකුත් වර්ෂයට අදාලව රැස්කළ රු. මි. 6 ක් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. මි. 43 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වන විට රු. මි. 26 දක්වා අඩු වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,436,958 ක් වූ හිඟ වරිපනම් සඳහා කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 ප්‍රකාරව වරිපනම් බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**2.2.4 කුලී**

**--------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩකුලී හා ටෙන්ඩර් බදුකුලී පිළිවෙලින් රු.1,466,109 ක් හා රු.2,045,832 ක් විය.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.708,375 ක් හා රු.2,500,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යසාධනය**

**------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත්, එම කාරණා වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන 1988 අගෝස්තු 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති අතුරු ව්‍යවස්ථා සභාව වැළඳගෙන ඒ අනුව කටයුතු කර තිබුණි.

(ආ) ඉටුනොකළ කර්තව්‍යයන්

-------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වටිනාකම රු.640,000 ක් වූ කර්මාන්ත 04 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

දිරන කසළ භාවිතා කර පොහොර නිෂ්පාදනය සිදුකර තිබුණ අතර නොදිරන කසළ වලින් වෙන් කරන ලද ප්‍රමාණයක් හොල්සිම් ආයතනයට යැවීම සිදුකර තිබුණි. ඉතිරි කසළ කොම්පෝස්ට් අංගනයේ වල දැමීම සිදුකර තිබුණි.

(ඈ) පාරිසරික ගැටළු

-------------------

සභා බල ප්‍රදේශය හරහා දිවෙන දුම්රිය මාර්ගයේ මෙන්ම දුම්රිය අංගනවල හා දුම්රිය ස්ථානවල ප්ලාස්ටික් බෝතල්, කෝප්ප, පොලිතීන් දවටන ඇතුළු අපද්‍රව්‍ය ඉවත් කිරීම විධිමත් පරිදි සිදුකර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීමේ සූදානම

--------------------------------------------------------------------

"තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව පුහුණු වැඩසටහන් හා ජන මාධ්‍ය තුළින් සභාව දැනුවත් වී තිබුණි. දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් යටතේ ස්වයං රැකියා පුහුණු වැඩසටහන්, ස්වයං රැකියාලාභී පවුල් සඳහා ආධාර හා උපකරණ ලබාදීම, කාන්තා ව්‍යවසායිකාවන් දැනුවත් කිරීම, නිවාස ආධාර ලබාදීම, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසැල් උපකරණ ලබාදීම හා ආකල්ප වර්ධනය වැනි කටයුතු සිදුකර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**--------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වාර්ෂිකව සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.1,101,616 ක් වූ සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් තැන්පතු 34 ක් ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමෙන් තොරව පැවති අතර එයින් රු.401,875 ක් වර්ෂ 01 සිට වර්ෂ 18 අතර කාලයක සිට පවතින ශේෂ විය.

(ඇ) ප්‍රාදේශීය සභා ඉඩම, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, පෙර පාසල් ගොඩනැගිල්ල, නිල නිවාසය හා ගරාජය තක්සේරු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

අනුමත කාර්ය මණ්ඩලයේ තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක් හා, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 10 ක් පැවතුණි.

(ආ) සේවක ණය

සේවය හැරගිය සේවකයින් දෙදෙනෙකුගෙන් රු.98,228 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

(i) ගොඩවෙල, බටගොල්ල ඉඩමෙන් 1994 වර්ෂයේ දී සභාවට ලැබී තිබුණු රූඩ් 01 පර්චස් 37.7 ක පොදු ඉඩම් කොටස විකුණා ඇති බවට සභාව අනාවරණය කරගෙන තිබියදී, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඉඩම් කොටසක්ද ආවරණය වන පරිදි අනවසර නිවාස කිහිපයක් ඉදිකර ජනතාව පදිංචි වී සිටින අතර, එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 3.4.2 පවරා නොගත් වත්කම්

සභාව භුක්ති විඳින ඉඩම් 08 කට අදාළ අයිතිය සභාවට පවරාගෙන නොතිබුණු අතර, එම ඉඩම් කොටස්වල ප්‍රමාණයන් සම්බන්ධයෙන් තොරතුරු සභාව සතුව නොතිබුණි.

### 3.4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍ර 04 ක් හා ලී බඩු හා උපකරණ 2015 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවති අතර මේවායේ වටිනාකම පිළිවෙළින් රු.1,397,152 ක් සහ රු.16,810 ක් විය.

(ආ) විශාකා පෙර පාසල අසල පිහිටි මාණ්ඩලික නිලධාරීන් සඳහා ලබාදෙන විධායක මට්ටමේ නිල නිවසක් හා ගරාජයක් වර්ෂ 11 ක සිට නිෂ්කාර්යයව පැවතුණි.

## 3.5 ප්‍රසම්පාදනය
-----------------

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

රු.1,742,294 ක ඇස්තමේන්තුවක් මත නිමකර තිබුණු පිදුරුවැල්ල ශ්‍රී සුදර්මාරාම විහාරස්ථානයේ පිවිසුම් මාර්ගයට කුට්ටිගල් ඇල්ලීම භෞතිකව පරීක්ෂා කිරීමේදී මාර්ගයේ ස්ථාන 34 ක විවිධ ප්‍රමාණයේ ගිලා බැසීම් හා මාර්ගයේ එක පැත්තක මීටර් 17x.0.4 ක ප්‍රමාණයක ගිලා බැසීම් පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
--------------------------------------

### 4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂයට අයවැයගත කර නොතිබුණු කර්මාන්ත 14 ක් ඉටු කිරීම වෙනුවෙන් රු.4,781,455 ක් වැයකර තිබුණි.

## 5. පද්ධති හා පාලන
------------------

විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) වත්කම්/දේපල පාලනය | (i) | ලේඛනගත නොකිරීම. |
| | (ii) | ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| | (iii) | නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඇ) ණයගැති/ණයහිමි පාලනය | (i) | උපලේඛන පිළියෙල නොකිරීම. |
| | (ii) | කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |
| | (ii) | නියමිත ප්‍රමිතියට ඉදිකිරීම් සිදු නොකිරීම. |